# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2017 අගෝස්තු

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2017 ජූලි මාසයේ 6.3%ක් වූ ලක්ෂ්‍යමය උද්ධමනය 2017 අගෝස්තු මාසයේදී 7.9%ක් දක්වා වැඩිවූ බව ප්‍රකාශ කලේය. උද්ධමනය ඉහළ යාමට 2016 අගෝස්තු මාසයේ පැවැති අඩු මිල මට්ටම් හේතු වී ඇත. මෙම වර්ෂයේ අගෝස්තු මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 5.3%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.7%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2016 අගෝස්තු මාසයේ ආහාර කාණ්ඩයේ මිළ ගණන් සාපේක්ෂව අවම මට්ටමක පැවතීම නිසා එම මාසයේ උද්ධමනය සඳහා මෙම එක් එක් කාණ්ඩයේ දායකත්වය පිළිවෙලින් 1.8%ක් හා 2.6%ක් විය.

කෙසේ නමුත් ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කළවිට, 2017 ජූලි මාසයේ 122.4 ක් වූ දර්ශක අගය 2017 අගෝස්තු මාසයේ 122.3ක් දක්වා පහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කල විට 2017 අගෝස්තු මාසයේ දර්ශකාංක 0.1ක අඩුවීමක් හෝ 0.1ක ප්‍රතිශතකාංක අඩුවීමක් ලෙස වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.25%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.16%කින් වැඩිවීම බලපා ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා සහල්, එළවළු, අළුත් මාළු, කුකුල් මස්, රතුළූණු, සුදුළූණු පොල් තෙල් සහ මිරිස් කුඩු යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් පොල්, අර්තාපල්, වියළි හාල්මැස්සන්, ලොකු ළූණු, අමු මිරිස්, දෙහි, තේ කොළ, කෙසෙල් සහ අඹ යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සසඳන කල 2017 අගෝස්තු මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'සෞඛ්‍ය', 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය', 'විවිධ භාණ්ඩ හා සේවා', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'ප්‍රවාහන', 'රෙදිපිළි හා පාවහන්' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. එමෙන්ම 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', සහ 'සන්නිවේදන, යන කාණ්ඩවල වියදම්වල වටිනාකමෙහි සුළු වැඩිවීමක් වාර්තා වේ. මෙම මාසය තුළ 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'ආපනශාලා හා හෝටල්' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | මිල දර්ශකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2016** | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 |
| | සැප්තැම්බර් | 113.5 | 0.2 | 4.7 |
| | ඔක්තෝම්බර් | 114.7 | 1.1 | 5.0 |
| | නොවැම්බර් | 116.6 | 1.7 | 4.1 |
| | දෙසැම්බර් | 118.0 | 1.2 | 4.2 |
| **2017** | ජනවාරි | 119.3 | 1.1 | 6.5 |
| | පෙබරවාරි | 119.9 | 0.5 | 8.2 |
| | මාර්තු | 119.5 | -0.3 | 8.6 |
| | අප්‍රේල් | 121.0 | 1.3 | 8.4 |
| | මැයි | 121.8 | 0.7 | 7.1 |
| | ජූනි | 123.4 | 1.3 | 6.3 |
| | ජූලි | 122.4 | -0.8 | 6.3 |
| | අගෝස්තු | 122.3 | -0.1 | 7.9 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව